01) වසමේ නම සහ අංකය :- 777C මාළඹේහේන

02) කෙටි හැඳින්වීමක් :-

බස්නාහිර පලාතේ කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත මැතිවරණ කොට්ඨාසයේ පිහිටියා වූ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වර්ග කිලෝ මීටර් 210.6 ක විශාලත්වයකින් සමන්විත වේ.කළුතර දිස්ත්‍රික්කයේ විශාලතම භූමි ප්‍රදේශයක පිහිටි මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ග්‍රාම නිලධාරී වසම් 60කින් සමන්විත වේ.

කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි වලල්ලාවිට ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ වසම් 60 අතරින් පොදු පහසුකම් වලින් සමන්විත 777ඝ මාළබේ හේන වසම ඓතිහාසික මෙන්ම පාරිසරික වශයෙන්ද වැදගත් වේ.ඉත්තපාන උපත්,විවාහ,මරණ රෙජිස්ටාර් කොට්ඨාසයට අයත් එමෙන්ම ඉත්තපාන ගොවිජන සේවා බල ප්‍රදේශයට හා ඉත්තපාන සමෘද්ධි කලාපයට අයත් මෙම ග්‍රාම නිලධාරී වසම මාළඹේ අක්කර 04,අක්කර 12,අක්කර 90 යන ග්‍රාමයන්ගෙන් සමන්විත වේ.

කඳු හෙල් තෙත් බිම් වලින් ගහණ වූ මෙම වසම ස්වභාවික සම්පත් හා විශාල ග්‍රාම බලකායකින් සමන්විත වන අතර යහපත් දේශගුණික තත්වයන්ගෙන් යුක්තය.සමස්තයක් වශයෙන් කදු නිම්න තැනිතලාවන්ගෙන් සමන්විත වන අතර වර්ෂය පුරා පැතිරුණු අධික වර්ෂාපතනයක් ලැබෙන කලාපයකි.

03) ගමන් මාර්ගය

ප්‍රදේශයට ලගා විය හැක්කේ අළුත්ගම සිට පැමිණ ලෙව්වන්දූව මන්සන්ධියෙන් දකුණට හැරී අවිත්තාව පාරේ 05ණප පමණ පැමිණි පසු මල්ලියවත්ත පොතු කුඹුරු ඇල පසු කරත්ම වම්පසට වන් අතුරු මාර්ගයක් හමුවේ.එම මාර්ගයේ 1/2නප පැමිණි පසු වසමට ළගාවිය හැක.මෙය එක් අතුරු මාර්ගයකි.මෙය බෙලිගහ හන්දිය පාර වේ.

අනෙක් මාර්ගය වන්නේ අළුත්ගම අවිතාව පාරේ 06ණප පමණ පැමිණි පසු වලල්ලාවිට ප්‍රාදේශීය සභා උපකාර්යාලයට යන මාර්ගයේ මීටර් 200 පමණ පැමිණි පසු වසමට ලගා විය හැක.මෙය ශ්‍රමදාන මාවතයි.

අවිත්තාව පාරේ කොල්වින් ආර්ද සිල්වා මහ විදුහල පසු කොට මීටර් 200 පමණ පැමිණි පසු සුනිල් චන්ද්‍රසේන මාවත ඔස්සේද මාළඹේ හේන වසමට ලගා විය හැක.

04) නම හැඳුණු ආකාරය

පැරණි ජනතාව ප්‍රකාශ කරන පරිදි අතීතයේ මෙම ප්‍රදේශය මහා ලැහැබක් (මහා වනාන්තරයක්) ලෙස පැවත ඇත.පසුව එය මාළඹේ කැලේ ලෙස භාවිතා කර ඇති අතර මේ වන විට මාළඹේ හේන ලෙස හඳුන්වයි.

1930 ගණන්වලදී වික්‍රමසිංහ මිනින්දෝරු තැන විසින් 99 අවුරුදු බදු ක්‍රමය යටතේ ජනතාවට ඉඩම් බෙදා දී ඇති බවද පැරණි මිනිසුන් පවසයි.

05) භූමියේ ස්වභාවය

මෙම ග්‍රාම නිලධාරී වසම මද කඳු සහිත තැනිතලා භූමියකින් යුක්ත ප්‍රදේශයකි.විශේෂයෙන්ම වී වගාවට යෝග්‍ය වූ භූ ලක්ෂණයන්ගෙන් සමන්විත වන අතර කඳුකර ප්‍රදේශ වල තේ,රබර්,කුරුඳු, වලටද යෝග්‍ය භූ ලක්ෂණ දැකගත හැකිය.විශේෂයෙන්ම මනුෂ්‍ය වාසයට ඉතා සුදුසු භූමියක් ලෙස මෙම ප්‍රදේශය හැඳින්විය හැක.

ප්‍රදේශය මධ්‍යයේ රැලි කඳු සහිත භූ ලක්ෂණ දක්නට ලැබෙන අතර ප්‍රදේශය පුරා තැනින් තැන හුදෙකලා කදු ද පිහිටා ඇති අතර වනාන්තර සඳහාද විශාල භූමි ප්‍රමාණයක් වෙන් වී ඇත.

මිරිස්වත්ත වතුයායට අයත් මාළඹෙවත්ත ප්‍රදේශයේ තේ රබර් හා කටුපොල් වගාව දක්නට ලැබෙන ආකාරය







පැල තවාන - තිලක් පද්මසිරි මහතා අපනයන කෘෂිකර්ම දෙපර්තමෙන්තුවේ ලියාපදිවි පැල තවානක් පවත්වාගෙන යන අතර ඔහු අක්කර 10 ක භූමි ප්‍රදේශයක තේ කුරුදු ගම්මිරිස් හා කෙසෙල් වගාව සිදු කරයි







